# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 11 දරන
# නාවික හමුදා
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 මාර්තු මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : රු. 1.20 ශ.   තැපැල් ගාස්තුව : රු. 1.00 ශ.

1993 අංක 11 දරන නාවික හමුදා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 53/89

නාවික හමුදා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1993 අංක 11 දරන නාවික හමුදා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) නාවික හමුදා පනතේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

"නිත්‍ය නාවික උපසේවය.

4. නිත්‍ය නාවික බලකායෙන් හෝ නිත්‍ය නාවික බලකායේ සේවයෙන් පසුව හෝ ජනාධිපතිවරයාගේ නියමයක් මගින් මාරු කරනු ලැබූ නිලධරයන්ගෙන් සහ නාවිකයන් බඳවා ගැනීමේ කොන්දේසිවලට අනුකූලව නිත්‍ය නාවික බලකායෙන් හෝ නිත්‍ය නාවික බලකායේ සේවයෙන් පසුව හෝ නිත්‍ය නාවික උපසේවය වෙත මාරු කරනු ලැබූ නාවිකයන්ගෙන් ද නිත්‍ය නාවික උපසේවය සමන්විත විය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) සිය අධිකාරියෙන් ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා වෙත භාර දෙන නිත්‍ය නාවික හමුදාවේ හෝ නිත්‍ය නාවික උපසේවය අධිකාරිලත් නිලධරයකු—

(අ) නාවික හමුදාවේ දේපළ වන්නා වූ ද ස්වකීය සන්තකයේ ඇත්තා වූ සියලු යුද්ධ ආයුධ, ඇඳුම් සහ නිල ලාංඡන (සාධාරණ ලෙස ගෙවීම සහ ක්ෂයවීම හැර) හොඳ තත්ත්වයෙන් නියමිත නිලධරයා වෙත ඔහු විසින් ආපසු භාර දෙන තුරු; සහ

(ආ) ඔහුගේ ඉල්ලා අස්වීම පිළිගනු ලැබූ බවට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තුරු

එම අධිකාරිලත් නිලධරයාගේ ධුරයේ කාර්යවලින් ඔහු නිදහස් කරනු නොලැබිය යුතු ය.

(ආ) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) ස්වේච්ඡා නාවික බලකායේ හෝ ස්වේච්ඡා නාවික උපසේවයේ අධිකාරිලත් නිලධරයකු, (3) වන උපවගන්තියට අනුකූලව සිය අධිකාරියෙන් ඉල්ලා අස්වීමේ දැන්වීම දී ඇති අවස්ථාවක, ඔහුගේ සන්තකයේ ඇති නාවික හමුදාවේ දේපළ වන සියලු යුධ ආයුධ, ඇඳුම් සහ නිල ලාංඡන (සාධාරණ ලෙස ගෙවීම සහ ක්ෂයවීම හැර) හොඳ තත්ත්වයෙන් නියමිත නිලධරයා වෙත ආපසු භාර දීමේ දී—

(අ) එම දැන්වීමේ නිශ්චිතව දැක්වෙන ඉල්ලා අස්වීමේ දිනයේ දී ඔහු සක්‍රිය සේවයේ නොමැති නම්; හෝ

(ආ) එම සේවයෙන් ඉල්ලා අස්වීමට ඉක්බිතිව ම ඔහු සක්‍රිය සේවයේ සිටි නම්

ඔහුගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීමට ඔහුට හිමිකම තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තියේ (2) වන උපවගන්තිය අවසානයට පහත දැක්වෙන අතුරු වගන්තිය එකතු කිරීමෙන් :—

"එසේ වුව ද නාවිකයකු යම් නිශ්චිත කාලයක් සඳහා නාවික හමුදාවට හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට සේවය කිරීම සඳහා බැඳුම්කරයකට ඇතුළත් වී ඇති විට, එම නිශ්චිත කාලසීමාව අවස්ථාවෝචිත පරිදි, මුල් බඳවා ගැනීමේ කාලසීමාව හෝ නැවත සේවයට බඳවා ගැනීමේ කාලසීමාව හෝ අභිබවා ගිය ද එය නොතකා එම නිශ්චිත කාලසීමාව අවසාන වනතුරු ඔහු නාවික හමුදාවේ සේවය කළ යුතුය."; තව ද

(ආ) එම වගන්තිය අවසානයේ දී පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) නිත්‍ය නාවික බලකායේ හෝ නිත්‍ය නාවික උපසේවයේ නාවිකයකු, ඔහුගේ සන්තකයේ ඇති නාවික හමුදාවේ දේපළ වන සියලු යුද්ධායුධ, ඇඳුම් සහ නිල ලාංඡන (සාධාරණ ලෙස ගෙවීම සහ ක්ෂයවීම හැර) හොඳ තත්ත්වයෙන් නියමිත නිලධරයා වෙත ආපසු භාරදෙනතුරු, නාවිකයකු වශයෙන් ඔහුගේ කාර්යවලින් ඔහු නිදහස් කරනු නොලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ ඇති "17 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව එම බලකායෙන් හෝ එම උප සේවයෙන් එම දිනයේ දී නිදහස් කරනු ලැබීමට ඔහුට හිමිකම තිබිය යුතු ය." යන වචන වෙනුවට "17 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව සහ ඔහුගේ සන්තකයේ ඇති නාවික හමුදාවේ දේපළ වන සියලු යුද්ධායුධ, ඇඳුම් සහ නිල ලාංඡන (සාධාරණ ලෙස ගෙවීම සහ ක්ෂයවීම හැර) හොඳ තත්ත්වයෙන් නියමිත නිලධරයා වෙත ඔහු විසින් ආපසු භාරදෙනු ලැබීමෙන් පසුව එම බලකායෙන් හෝ එම උප සේවයෙන් එම දිනයේ දී නිදහස් කරනු ලැබීමට ඔහුට හිමිකම තිබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ ඇති "වරද සිදු කිරීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ඇතුළත හෝ එම කාලය ඇතුළත ඔහු ශ්‍රී ලංකාවෙන් බැහැරව සිට ඇති අවස්ථාවක ඔහු ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමෙන් පසු අවුරුද්දක් ඇතුළත" යන වචන වෙනුවට "වරද සොයා ගනු ලැබූ දින සිට අවුරුදු තුනක් ඇතුළත හෝ එම කාලය ඇතුළත ශ්‍රී ලංකාවෙන් බැහැරව සිට ඇති අවස්ථාවක ඔහු ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමෙන් පසු අවුරුද්දක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඇති අතුරු වගන්තියේ ඇති "එම වරද සිදු කිරීමේ දිනයෙන් පසුව මාස හයක කාලයක් ගතවීමෙන් පසුව" යන වචන වෙනුවට "එම වරද සොයා ගැනීමේ දිනයෙන් පසුව අවුරුදු දෙකක කාලයක් ගතවීමෙන් පසුව" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තිය එම වගන්තියේ (2) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(ආ) එසේ නැවත අංක යෙදූ (2) වන උපවගන්තියෙහි ඇති "මරණ දඬුවම දිය නොහැකි නාවික වරදක්" යන වචන වෙනුවට "මරණ දඬුවම දිය නොහැකි වරදක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) නැවත අංක යෙදූ (2) වන උපවගන්තියට පෙරාතුවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1) යුද්ධාධිකරණයක් විසින් විභාග කළ යුතු බවට මේ පනත මගින් ප්‍රකාශිතවම නියම කර ඇති වරදක් සම්බන්ධයෙන් හැර, ලුතිනන්ත් වරයකුගේ නිලය හෝ ඊට වඩා අඩු නිලයක් හෝ දරන නිලධරයකු, මරණ දඬුවම දිය නොහැකි වරදකට චෝදනා ලැබ සිටින අවස්ථාවක දී, චූදිතයා ලඝුකාර්ය පටිපාටිය අනුව නඩු විභාගයට කැමති

ද නැතහොත් යුද්ධාධිකරණයක් මගින් නඩු විභාගයට කැමති ද යන්න නාවික හමුදාපතිවරයා විසින් හෝ නාවික හමුදාපතිවරයා විසින් බලය පවරන ලද කපිතාන් වරයකුගේ නිලයට වඩා අඩු නොවන නිලයක නිලධර යකු විසින් හෝ චූදිතයාගෙන් විමසිය යුතු අතර යුද්ධාධි කරණයක් මගින් නඩුව විභාග කිරීමට චූදිතයා තෝරා ගතහොත් එසේ යුද්ධාධිකරණයක් මගින් නඩුව විභාග කිරීමට පියවර ගත යුතු අතර ලඝුකාර්ය පටිපාටියට අනුව නඩුව විභාග කිරීමට ඔහු කැමති වුවහොත් එසේ ලඝුකාර්ය පටිපාටිය අනුව නඩුව විභාග කිරීමට පියවර ගත යුතුය ; එසේ වුව ද එම නිලධරයාට නියම කළ හැකි දඬුවම ජ්‍යෙෂ්ඨත්වය නැති කිරීම හෝ දණ්ඩන ලැයිස් තුවේ තදබල කමින් අඩු දඬුවමක් හෝ විය යුතු ය.";

(ඇ) එම වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

"හමුදාපතිවරයා විසින් හෝ අණදෙන නිලධාරීන් විසින් ලඝු කාර්ය පටිපාටිය අනුව වරදකරුවන් පිළිබඳව නඩු විභාග කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ලඝු කාර්ය පටිපාටිය අනුව හෝ යුද්ධාධි කරණයක් විසින් හෝ නඩුව විභාග කිරීම තෝරා ගැනීමට සුළු නිලධරයකු හෝ බලලත් නිලධරයකු වෙත වරදකරු වකුට ඇති අයිති වාසිකම.

29. විනයානුකූල වරදක් හෝ යුද්ධාධිකරණය විසින් විභාග කළ යුතු බවට මේ පනත මගින් ප්‍රකාශිතවම නියම කර ඇති වරදක් හැර මරණ දඬුවම දිය නොහැකි වරදක් සම්බන්ධයෙන් බලලත් නිලධරයකු හෝ සුළු නිලධරයකු හෝ චෝදනා ලැබ සිටින අවස්ථාවක දී, ඔහු ලඝු කාර්ය, පටිපාටිය අනුව නඩු විභාගයට කැමති ද නැතහොත් යුද්ධාධිකරණයක් මගින් නඩු විභාගයට කැමති ද යන්න ඔහුගේ අණ දෙන නිලධරයා විසින් ඔහු ගෙන් විමසිය යුතු අතර යුද්ධාධිකරණය මගින් නඩු විභාගය ඔහු විසින් තෝරා ගනු ලැබුවහොත් එම අණ දෙන නිලධරයා විසින් යුද්ධාධිකරණය මගින් එම නඩුව විභාග කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ඇති "ලුතිනන් කමාන්ඩර්වරයාගේ නිලයට වඩා අඩු නොවන නිලයක" යන වචන වෙනුවට "කපිතාන්වරයකුගේ නිලයට වඩා අඩු නොවන නිලයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (8) වන උපවගන්තියේ ඇති "නම් කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "නම් කරනු ලැබිය යුතු අතර යුද්ධාධිකරණයේ අනෙක් සාමාජිකයන් යුද්ධාධිකරණය නියම කරන බලධරයා විසින් නම් කරනු ලැබිය හැකිය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම වගන්තියේ (12) වන උපවගන්තියේ ඇති "මේ වගන්තියේ අනෙක් විධිවිධානවලට යටත්ව, යුද්ධාධි කරණයක් පැවැත්වීමට ඇති විට, එහි දී සභාපති ධුරය දැරීමට පත්කර ඇති නිලධරයා විසින්" යන වචන වෙනුවට "මේ වගන්තියේ අනෙක් විධිවිධානවලට යටත්ව, යුද්ධාධිකරණයක් පැවැත්වීමට ඇති විට, යුද්ධාධිකරණය නියම කරන බලධරයා විසින් අනෙක් සාමාජිකයන් නම් කරනු ලැබ ඇත්නම් මිස, එහි දී සභාපති ධුරය දැරීමට පත්කර ඇති නිලධරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "ඉරිදා දිනවල දී හැර" යන වචන වෙනුවට "1971 අංක 29 දරන නිවාඩු පනතේ අර්ථානුකූලව රජයේ නිවාඩු දින යන්හි දී හැර" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් අතුරු වගන්තිය එකතු කිරීමෙන්:—

"එසේ වුව ද, යම් යුද්ධාධිකරණයක පැවැත්වුණ යම් නඩු කටයුත්තක් රජයේ නිවාඩු දිනයක පැවැත්වීමේ හේතුව මත පමණක් එම නඩු කටයුත්තේ වලංගුභාවයට බලපෑමක් සිදු නොවිය යුතු ය.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ඇති "වචන හැත්තෑ දෙකකින් යුත් සෑම පිටුවක් සඳහාම නියම් කරනු ලැබිය හැකි පරිදි ශත දහයකට වැඩි නොවන අනුපාතයකට" යන වචන වෙනුවට "නියම කරනු ලැබිය හැකි පරිදි වූ අනුපාතයකට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ඇති "සේවය අත්හැර යාමට වරදකරු නොවී නිවාඩු නොමැතිව නොපැමිණ සිටින" යන වචන වෙනුවට "සේවය අත් හැර යාමට වරදකරු නොවී නිවාඩු නොමැතිව නොපැමිණ සිටින හෝ ඔහුගේ නැවෙන් හෝ සේවා ස්ථානයෙන් අනිසි ලෙස ඉවත් වයන" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියේ ඇති "සේවය අත්හැර යාමට වරදකරු නොවී නිවාඩු නොමැතිව නොපැමිණ සිටින" යන වචන වෙනුවට "සේවය අත්හැර යාමට වරදකරු නොවී නිවාඩු නොමැතිව නොපැමිණ සිටින හෝ ඔහුගේ නැවෙන් හෝ සේවා ස්ථානයෙන් අනිසි ලෙස ඉවත්ව යන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) "තම ඉහළ නිලධරයා ස්වකීය ධුරයේ කටයුතුවල යෙදී සිටියද එසේ නැති වුව ද එම ඉහළ නිලධරයාට එරෙහිව" යන වචන වෙනුවට "නාවික නීතියට යටත් වන වෙනත් යම් තැනැත්තකු ස්වකීය ධුරයේ කටයුතුවල යෙදී සිටියද එසේ නැති වුවද එම තැනැත්තාට එරෙහිව" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම වගන්තියේ පැති සටහනේ ඇති "ඉහළ නිලධරයන්ට" යන වචන වෙනුවට "නාවික නීතියට යටත් යම් තැනැත්තකුට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය සංශෝධනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) "තම ඉහළ නිලධරයකුගේ යම් නීත්‍යානුකූල අණක් සිතා මතා පිළි නොපදින හෝ සිය ඉහළ නිලධරයාට එරෙහිව තර්ජනාත්මක හෝ අපහාසාත්මක වචන පාවිච්චි කරන හෝ එම නිලධරයාට අපහාස වන පරිදි හැසිරෙන නාවික නීතියට යටත් යම් තැනැත්තකු" යන වචන වෙනුවට "තම ඉහළ නිලධරයකුගේ හෝ 24 වන වගන්තිය යටතේ සිය රාජකාරි ඉටුකරන කනිෂ්ඨ නිලධරයකුගේ හෝ යම් නීත්‍යානුකූල අණක් සිතා මතා පිළි නොපදින හෝ සිය ඉහළ නිලධරයාට හෝ 24 වන වගන්තිය යටතේ සිය රාජකාරි ඉටු කරන යම් කනිෂ්ඨ නිලධරයකුට හෝ එරෙහිව තර්ජනාත්මක හෝ අපහාසාත්මක වචන පාවිච්චි කරන හෝ එම නිලධරයන්ට අපහාස වන පරිදි හැසිරෙන නාවික නීතියට යටත් යම් තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම වගන්තියේ පැති සටහනේ ඇති "ඉහළ නිලධරයන්ට" යන වචන වෙනුවට "ඉහළ නිලධරයන්ට හෝ කනිෂ්ඨ නිලධරයන්ට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ (ආ) ඡේදයේ ඇති "අවුරුදු තුනකට නොඅඩු කාලයක් සඳහා හෝ" යන වචන වෙනුවට "අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා හෝ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තියේ ඇති "අවුරුදු තුන කට නොඅඩු කාලයක් හෝ දඬුවම් ලැබිස් තුවේ ඇති බරපතලකමින් අඩු දඬුවමක්" යන වචන වෙනුවට "අවුරුදු තුනකට නො අඩු කාල යක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තියේ ඇති "නාවික හමුදාවේ ප්‍රයෝජනය සඳහා" යන වචන වෙනුවට "නාවික හමුදාව විසින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එහි (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) නොසැලකිල්ලෙන් ඒ දේපළක් නැති කරන හෝ පරිහානිය ඇති කිරීමට සලස්වන;";

(ආ) එහි (ඇ) ඡේදයේ ඇති "හානි සිදු කරන" යන වචන වෙනුවට "හානි සිදුකරන හෝ විනාශ කරන" යන වචන ආදේශ කිරීමෙන්.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තියේ ඇති "එවැනි බලකායන්ට හානිකර බලපෑම් ඇති කරන" යන වචන වෙනුවට "එවැනි බලකායන්ට හානිකර බලපෑම් ඇති කරන හෝ හානිකර බලපෑම් ඇති කිරීමට ඉඩ ඇති" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තිය සංශෝධනය කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(ආ) එම වගන්තිය අවසානයට පහත දැක්වෙන අලුත් අතුරු වගන්තිය එකතු කිරීමෙන් :—

"එසේ වුවද, උත්තමාචාරයකදී, ආචාර පෙළපාලියක දී, උත්සවයක දී හෝ වෙනත් සේවා උත්සවයක දී එම වරද සංයුක්ත වන ක්‍රියාවක්, හැසිරීමක්, අවිනයක් හෝ පැහැර හැරීමක් කරනු ලැබුවේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා අවුරුදු විස්සකට වැඩි නොවන කාලයක් සඳහා බරපතල වැඩ ඇතිව සිර දඬුවමකින් දඬුවම් කරනු ලැබිය යුතු ය."; සහ

(ඇ) එම වගන්තිය අවසානයට පහත දැක්වෙන අලුත් උප වගන්තිය එකතු කිරීමෙන් :—

"(2) වෙනත් තැනැත්තකු විසින් මේ පනත යටතේ වූ වරදක් සිදු කිරීමෙහි ලා ඔහුට ආධාර කරන, උපකාර කරන, උපදෙස් දෙන හෝ ඔහු ලවා එම වරද සිදු කරවන නාවික නීතියට යටත් යම් තැනැත්තකු වරදකට වරද කරුවකු වන අතර පළමුවෙන් සඳහන් කරන ලද වරද සම්බන්ධයෙන් වන නඩු විභාගය සඳහා නිශ්චිතව දක්වෙන ආකාරයට නඩු විභාගය පවත්වනු ලැබිය යුතු අතර පළමුවෙන් සඳහන් කරන ලද වරද සඳහා නිශ්චිතව දැක්වෙන දඬුවමට ම යටත් විය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තිය සංශෝධනය කිරීම*

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තියේ ඇති "රුපියල් දෙසියයකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පන්දහස කට වැඩි නොවන දඩයකින් හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකින්ම හෝ දඬුවම් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය සංශෝධනය කිරීම.*

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තියේ ඇති "ඔහු නාවිකයකු ලෙස බඳවා ගැනීම" යන වචන වෙනුවට "ඔහු නිලධරයකු ලෙස පත් කිරීම හෝ ඔහු නාවිකයකු ලෙස බඳවා ගැනීම" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය සංශෝධනය කිරීම.*

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එම වගන්තියේ (අ) ඡේදයේ ඇති "නිවාඩු නොලබා නොපැමිණ සිටින හෝ යම් නිලධරයකුට හෝ නාවිකයකුට සේවය අත්හැර යාමට හෝ නිවාඩු නොලබා නොපැමිණ සිටීමට සැලැස්වීමට හෝ අනුබලදීමට උත්සාහ කරන හෝ" යන වචන වෙනුවට "නිවාඩු නොලබා නොපැමිණ සිටින හෝ අනිසි ලෙස ඉවත්ව යන හෝ යම් නිලධරයකුට හෝ නාවිකයකුට සේවය අත්හැර යාමට හෝ නිවාඩු නොලබා නොපැමිණ සිටීමට හෝ අනිසි ලෙස ඉවත්ව යාමට සැලසීමට හෝ අනුබල දීමට උත්සාහ කරන" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (ආ) ඡේදයේ ඇති "නිලධරයකු හෝ නාවිකයකු සේවය අත්හැර යාමට හෝ නිවාඩු නොලබා නොපැමිණ සිටීමට යන බව දැනුවත්ම, ඔහුට සේවය අත් හැර යාමට හෝ නිවාඩු නොලබා නොපැමිණ සිටීමට උදව් වන" යන වචන වෙනුවට "නිලධරයකු හෝ නාවිකයකු සේවය අත්හැර යාමට හෝ නිවාඩු නොලබා නොපැමිණ සිටීමට හෝ අනිසි ලෙස ඉවත්ව යාමට යන බව දැනුවත් වම, ඔහුට සේවය අත්හැර යාමට හෝ නිවාඩු නොලබා නොපැමිණ සිටීමට හෝ අනිසි ලෙස ඉවත්ව යාමට උදව් වන" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එම වගන්තියේ (ඇ) ඡේදයේ ඇති "නිවාඩු නොමැතිව නොපැමිණ සිටින්නකු" යන වචන වෙනුවට "නිවාඩු නොමැතිව නොපැමිණ සිටින්නකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය අයකු" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඈ) එම වගන්තියේ පැති සටහනේ ඇති "නිවාඩු නොමැතිව නොපැමිණ සිටීමට" යන වචන වෙනුවට "නිවාඩු නොමැතිව නොපැමිණ සිටීමට හෝ අනිසි ලෙස ඉවත්ව යාමට" යන වචන ආදේශ කිරීමෙන්.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තියේ (1) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එහි (ආ) ඡේදයේ ඇති "උකස් කිරීමට හෝ දීමට" යන වචන වෙනුවට "උකස් කිරීමට, දීමට හෝ විනාශ කිරීමට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එහි (ඇ) ඡේදයේ ඇති "උකස් කිරීම, බැහැර කිරීම" යන වචන වෙනුවට "උකස් කිරීම, විනාශ කිරීම හෝ බැහැර කිරීම" යන වචන ආදේශ කිරීමෙන්.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තියේ ඇති "ළඟම ඇති සිවිල් අධිකරණය වෙත" යන වචන වෙනුවට "ළඟම ඇති කලාපයේ පවත්වනු ලබන මහාධිකරණය වෙත" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය සංශෝධනය කිරීම.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ), (ඒ), (ඔ), (ඕ), (ක), යන ඡේද වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) මරණය ;

(ආ) බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීම ;

(ඇ) අපකීර්තිය සහිතව නාවික හමුදා සේවයෙන් නෙරපීම ;

(ඈ) බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම ;

(ඉ) අපකීර්තිය නොමැතිව නාවික හමුදා සේවයෙන් නෙරපීම ;

(ඊ) රඳවා තබා ගැනීම ;

(උ) යම් නිශ්චිත කාලයකට හෝ අනියතකාලයකට නිලධරයකු ලෙස ඇති ජ්‍යෙෂ්ඨත්වය නැති කිරීම ;

(ඌ) යටත් නිලධරයන්, බලලත් නිලධරයන් හෝ සුළු නිලධර යන් නිල තත්ත්වයෙන් පහත දැමීම ;

(එ) වැටුප් දීමනා සහ අයවිය යුතු වෙනත් දීමනා, වරදකරුට දෙන ලද නිල ලාංඡන, සැරසුම් හෝ එවැනි වෙනත් දේ රාජසන්තක කිරීම. තවද සේවය අත්හැර යාමකදී සේවය අත්හැර ගිය තැනැත්තා විසින් නැවේ හෝ ඔහු අත්හැර ගිය ස්ථානයේ දමා ගිය සියලු ඇඳුම් හා වෙනත් බඩු බාහිරාදිය රාජ සන්තක කිරීම ;

(ඒ) දැඩි ලෙස තරවටු කිරීම ;

(ඔ) තරවටු කිරීම ;

(ඕ) නියම කරනු ලැබිය හැකි වෙනත් සුළු දඬුවම්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 144 වන වගන්තිය සංශෝධනය කිරීම.

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 144 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ ඇති "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු" යන වචන වෙනුවට "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (2) වන උපවගන්තියේ ඇති "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු" යන වචන වෙනුවට "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එම වගන්තියේ පැති සටහනේ ඇති "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු" යන වචන වෙනුවට "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තිය සංශෝධනය කිරීම.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තන්" යන වචන වෙනුවට "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තන් හෝ අනිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (අ) ඡේදයේ ඇති "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු" යන වචන වෙනුවට "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එම වගන්තියේ (ආ) ඡේදයේ ඇති "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු" යන වචන වෙනුවට "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) එම වගන්තියේ (ආ) ඡේදයේ (i) අනුඡේදයේ ඇති "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු" යන වචන වෙනුවට "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඉ) එම වගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ ඇති "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු" යන වචන වෙනුවට "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඊ) එම වගන්තියේ (ඇ) ඡේදයේ ඇති "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු" යන වචන වෙනුවට "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(උ) එම වගන්තියේ (ඉ) ඡේදයේ ඇති "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු ලෙස පොලිස් නිලධරයකුට භාරවූ අවස්ථාවක දී, ඔහු රැගෙන එනු ලැබූ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් වහාම පරීක්ෂණයක් පවත්වා එම නිලධරයා හෝ නාවිකයාගේ පාපොච්චාරණයෙන් ඔහු සේවය අත්හැර ගිය අයකු හෝ නිවාඩු නොමැතිව නොපැමිණ සිටි අයකු බව පෙනී ගියහොත්," යන වචන වෙනුවට "නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු ලෙස හෝ අනිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු ලෙස පොලිස් නිලධරයකුට භාර වූ අවස්ථාවක දී ඔහු රැගෙන එනු ලැබූ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් වහාම පරීක්ෂණයක් පවත්වා එම නිලධරයාගේ හෝ නාවිකයාගේ පාපොච්චාරණයෙන් ඔහු සේවය අත්හැර ගිය අයකු හෝ නිවාඩු නොමැතිව නොපැමිණ සිටි අයකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය අයකු බව පෙනී ගියහොත්" යන වචන ආදේශ කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම.**

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) අනුපිළිවෙලින් "සිවිල් අධිකරණය", "අමාත්‍යවරයා", "නාවිකයා", "ඉහළ නිලධරයා" යන යෙදුම්වල අර්ථ කථන වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ කථන ආදේශ කිරීමෙන්—

"සිවිල් අධිකරණය" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හෝ පාර්ලිමේන්තුවේ වෙනත් පනතක් යටතේ හෝ පිහිටුවන ලද යම් අධිකරණයක් අදහස් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන් රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ ;

"නාවිකයා" යන්නෙන් නිලධරයකු නොවන නාවික හමුදා වේ සාමාජිකයකු අදහස් වන අතර එයට කාන්තා නාවිකයකු ඇතුළත් වේ ; සහ

"ඉහළ නිලධරයා" යන්නට යම් නිලධරයකු, බලලත් නිලධරයකු සහ සුළු නිලධරයකු ඇතුළත් වේ.

(ආ) එම වගන්තියේ අවසානයේ පහත දැක්වෙන අලුත් අර්ථ කථනය එකතු කිරීමෙන් :—

"බලලත් නිලධරයා" යන්නෙන් පාලක ප්‍රධාන සුළු නිලධරයකු හෝ සමූහ ප්‍රධාන සුළු නිලධරයකු අදහස් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධානවල පොදු සංශෝධනය.

33 ප්‍රධාන ප්‍රඥප්තියේ යම් විධිවිධානයක "ස්ථිර ලේකම්වරයා" යන වචන ඇති ඕනෑම ස්ථානයක ඒ වෙනුවට "ලේකම්වරයා" යන වචනය ආදේශ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

34. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.